# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1960/44 - 2016 මාර්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2016.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**

ව්‍යතිරේක (නිදහස් කිරීම්) නියෝගය

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතෙහි 9(අ) වගන්තිය යටතේ (සංශෝධිත)**

**1. ව්‍යතිරේකය ප්‍රදානය කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතෙහි (මෙහි මින්මතු ''පනත'' යනුවෙන් හඳුන්වනු ලබන) 9 (අ) වැනි වගන්තිය අනුව පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියාත්මක ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (මෙහි මින්මතු ''කොමිෂන් සභාව'' යනුවෙන් හඳුන්වනු ලබන), යම් පුද්ගලයෙක් හෝ පුද්ගල ගණයක් (මෙහි මින්මතු ''බලපත්‍රවලින් නිදහස් කරන ලද පුද්ගලයා'' යනුවෙන් හඳුන්වනු ලබන) ඃ

එවැනි පුද්ගලයෙක් හෝ පුද්ගල ගණයක් තමා විසින් උත්පාදනය කරනු ලබන විදුලිබලය බෙදා හැරිය යුතු පුද්ගලයින් සංඛ්‍යාව 200 ට අඩු, කි. වො. 100 ට අඩු ධාරිතාවයකින් යුතු ජාතික විදුලිබල පද්ධතියෙන් වෙන් ව, සහ මෙම නියෝගයෙහි සඳහන් කොන්දේසි වලට යටත්ව, ප්‍රජා පාදක, වාණිජමය නොවන ක්ෂුද්‍රජල විදුලිබල උත්පාදන ව්‍යාපෘතියක නියැලී සිටින අවස්ථාවක, විදුලිබලය උත්පාදන, හෝ බෙදාහැරීම් සහ සැපයීමේ සීමිත කාර්යයන් සඳහා බලපත්‍රය ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් මෙයින් නිදහස් කරනු ලබයි.

**2. අනුමැතිය**

බලපත්‍රවලින් නිදහස් කරන ලද පුද්ගලයෙක් හෝ පුද්ගල ගණයක් විසින් 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතෙහි (සංශෝධිත) විධිවිධාන ද ඇතුළත්ව, නමුත් එයට සීමා නොවී, විදුලි උත්පාදන සිදුකිරීම පිණිස අදාළ නීති, රෙගුලාසි සහ රීති යටතේ අවශ්‍ය වන අනුමැතිය ලබාගත යුතු ය.

**3. ව්‍යතිරේක නියමයන්**

මෙයින් ප්‍රදානය කර ඇති බලපත්‍රවලින් නිදහස් කිරීම, 2013.08.23 දින සිට බල පැවැත්වෙන අතර, පහත නිදහස් කිරීමේ නියෝගයෙහි ව්‍යතිරේකය අහෝසි කිරීම සහ ඉවත් කර ගැනීමේ විධිවිධානවලට යටත්ව අහෝසි කරන්නේ නම් හෝ ඉවත් කරන්නේ නම් මිස, 2013.08.13 සිට වසර 05 ක කාලයක් සඳහා අඛණ්ඩව හා පූර්ණ වශයෙන් බල පැවැත්වෙනු ඇත.

**4. ව්‍යතිරේකය අහෝසි කිරීම සහ ඉවත්කර ගැනීම**

පනතෙහි 9 (අ) වගන්තිය පරිදි කොමිෂන් සභාවෙහි අභිමතය පරිදි බලපත්‍රවලින් නිදහස් කිරීම අහෝසි කිරීම හෝ ඉවත් කර ගැනීම සිදු කළ හැකි ය.

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

1A - PG 2908 — 09 (2016/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ව්‍යතිරේක කොන්දේසි*

**1 වන කොන්දේසිය : අර්ථනිරූපණය සහ අභිසංස්කරණය**

1. එයට පටහැනි අරමුණක් පෙනී යන්නේ නම් මිස :

(අ) කොන්දේසිවල හෝ උපලේඛනයන්හි භාවිතා කර ඇති වචන සහ ප්‍රකාශන ඒවා ප්‍රඥප්තියක සහ ඒවාට අදාළ වන අර්ථ නිරූපණ පනත්හි භාවිතා කර ඇති ආකාරයටම අර්ථ විග්‍රහ කළ යුතු අතර,

(ආ) ප්‍රඥප්තියක් සඳහා වන නිර්දේශනයන් තුළ ප්‍රාථමික සහ යටත් නීති සම්පාදනයන් සහ අවස්ථා දෙකෙහි දී ම, මෙම නිදහස් කිරීම බලාත්මක වූ දිනට පසු එයට සිදුකරනු ලබන යම්කිසි වෙනස් කිරීමක් හෝ ප්‍රති පැනවීමක් අන්තර්ගත විය යුතු ය.

2. පනතේ කිසියම් විධිවිධානයක කාර්යයන් සඳහා එහි අර්ථ දක්වෙන ඕනෑම වචනයක් හෝ ප්‍රකාශනයක්, එයට පටහැණි අරමුණක් බව පෙනී යන්නේ නම් මිස, ඒවා කොන්දේසිවල හෝ උපලේඛනයන්හි භාවිත කරන විට යොදා ගැනෙන අර්ථයම පැවතිය යුතු ය.

3. අන් ආකාරයකින් දක්වා ඇත්නම් හෝ පාඨය තුළ වෙනත් ආකාරයකින් අවශ්‍ය කරන්නේ නම් මිස, කොන්දේසිවල හා උපලේඛනයන්හි වදන්වල පහත අර්ථයන් ගෙන දේ, :

''අනුමත කළ'' කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අදහස දෙන අතර,
''අනුමැතිය'' යන්නට අනුරූප අර්ථය තිබිය යුතු ය, ;

''බලපත්‍රලාභියා'' 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතෙහි 13 වන වගන්තිය යටතේ වලංගු බලපත්‍රයක් හිමි තැනැත්තෙක්.

''විදුලිබල ව්‍යාපාරය'' විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම සහ සැපයුමෙහි නිරතව සිටින කිසියම් පුද්ගලයෙක් අදහස් කෙරේ ;

''වෙනස් කිරීම'' එක්කිරීම, බැහැරකිරීම, සංශෝධනය සහ ආදේශය ඇතුළත් වන අතර ඒ අනුව සජාතීය ප්‍රකාශන විග්‍රහ කළ යුතු ය ;

''ම.උ.කො.ස. පනත'' 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත අදහස් කෙරේ ;

''සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා'' පනතෙහි 13(1) (ඇ) (ඔ) (ආ) වගන්තිය යටතේ විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම සඳහා බලපත්‍රයක් දරන්නෙක් අදහස් කෙරේ ;

''බෙදාහැරීම් බලපත්‍රලාභියා'' පනතෙහි 13(1) (ඇ) (ඔ) (ඇ) වගන්තිය යටතේ විදුලිබලය බෙදාහැරීම සහ සැපයුම හෝ බෙදාහැරීම පිණිස බලපත්‍රයක් දරන්නෙක් අදහස් කෙරේ ;

''උත්පාදන බලපත්‍රය'' පනතෙහි 13(1) (ඇ) (ඔ) (අ) වගන්ති යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් අදහස් කෙරේ ;

''උත්පාදන පිරියත'' විදුලිබල උත්පාදනය සඳහා යොදා ගන්නා හෝ එයට සම්බන්ධිත කාර්යයන් සඳහා භාවිතා කරන කිසියම්, උපකරණයක්, උපාංගයක් හෝ උවාරණයක් අදහස් කෙරේ ;

4. වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් මිස :

(අ) අංකනය කරන ලද කොන්දේසියක් හෝ උපලේඛනයක් සඳහා වන කිසියම් නිර්දේශනයක් අනුපිළිවලින් මෙම නිදහස් කිරීම් නියෝගයෙහි එම අංකය දරන කොන්දේසියට හෝ උපලේඛනයට නිර්දේශනයක් වේ ;

(ආ) අංකනය කරන ලද වාක්‍යාංශයක් සඳහා වන කිසියම් නිර්දේශනයක්, නිර්දේශනය දක්නට ලැබෙන උපලේඛනයෙහි එම අංකය දරන වාක්‍යාංශයට නිර්දේශනයක් වේ ;

(ඇ) අංකනය කරන ලද ඡේදයක් සඳහා වන කිසියම් නිර්දේශනයක්, නිර්දේශනය දක්නට ලැබෙන උපලේඛනයෙහි එම අංකය දරන වාක්‍යාංශයට නිර්දේශනයක් වේ ;

එවැනි විචලනයක්, පරිපූරකයක් හෝ ප්‍රතිස්ථාපනයකට අගතියක් සිදු නොකර, යම් ගිවිසුමක කිසියම් නිර්දේශනයක්, නිදහස් කිරීමේ නියෝගයක් (මෙම නිදහස් කිරීම් නියෝගය හැර), නීති සංග්‍රහයක් හෝ වෙනත් ලියවිල්ලක කලින් කළට වෙනස්කරනු ලබන, පරිපූරණය කරන ලබන හෝ ප්‍රතිස්ථාපනය කරනු ලබන ආකාරයට එවැනි ගිවිසුමක්, නිදහස් කිරීම් නියෝගයක්, හෝ නීති සංග්‍රහයක් හෝ ලියවිල්ලක් සඳහා වන නිර්දේශනයක් ඇතුළත් විය යුතු ය.

5. කිසියම් කොටසක, කොන්දේසියක, උපලේඛනයක හෝ ඡේදයක ශීර්ෂ පාඨය හෝ මාතෘකාව එහි සන්දර්භයට බලපෑම් නොකළ යුතු ය.

6. නිදහස් කිරීම් නියෝගයෙහි කිසියම් වගකීමක් නිශ්චිත කාල සීමාවක් තුළ ඉටුකිරීමට අවශ්‍ය කෙරෙන අවස්ථාවක දී, එකී කාල සීමාව තුළ එම වගකීම ඉටුකිරීමට බලපත්‍රවලින් නිදහස් කරන ලද පුද්ගලයෙක් සම්බන්ධයෙන් එම කාල සීමාවට පසුව ද, එකී වගකීම අඛණ්ඩව, ස්ථිරසාර සහ බලාත්මකව පවතී. (නමුත් කාල සීමාව ඇතුළත එය ඉටුකිරීමට බලපත්‍රවලින් නිදහස් කරන ලද පුද්ගලයෙකුගේ අසමත්වීමේ හේතුව මත ඔහුට එරෙහිව පවත්නා සියලු අයිතිවාසිකම් සහ පිළියම් සඳහා අගතියක් සිදු නොකර එය බලපැවැත්වේ.)

7. මෙම නිදහස් කිරීම් නියෝගය සහ පනත අතර යම් අනනුකූලතාවක් පවතී නම්, එවන් කිසියම් අනනුකූලතාවක් ඇති තාක් දුරට පනත බලපැවැත්විය යුතු ය. මෙහි දක්වා ඇති කොන්දේසිවලට අමතරව, පනතෙහි දක්වා ඇති කොන්දේසි නිදහස් කිරීම් නියෝගයෙහි අනුකලන කොටසක් විය යුත්තේ ය.

**කොන්දේසිය 2 : කොමිෂන් සභාවට තොරතුරු සැපයීම**

1. බලපත්‍රවලින් නිදහස් කරන ලද පුද්ගලයෙක්, කොමිෂන් සභාව විසින් අවශ්‍ය කරනු ලබන ආකාරයට හා එකී අවස්ථාවල, කොමිෂන් සභාව වෙත එවන් තොරතුරු ඉදිරිපත් කළ යුතු අතර, කොන්දේසි සැලකිල්ලට ගෙන කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන හෝ පනත හෝ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත යටතේ එයට වෙන් කර දී ඇති හෝ පැවරී ඇති කාර්යභාරය ඉටුකිරීමේ අරමුණ සඳහා එයට අවශ්‍ය විය හැකි එවැනි වාර්තා සපයාගැනීම හා එයට ඉදිරිපත් කිරීම සිදුකළ යුතු ය.

2. I වන ඡේදය යටතේ තොරතුරු ඉල්ලා සිටීමට කොමිෂන් සභාව සතු බලය මගින් මෙම නිදහස් කිරීමේ නියෝගයෙහි වෙනත් කිසියම් කොන්දේසියක් යටතේ හෝ එයට අනුකූලව හෝ පනතෙහි, මහජන උපයෝගීතා කොමිෂන් සභා පනතෙහි හෝ වෙනත් කිසියම් ආඥාපනතක් යටතේ හෝ එයට අනුකූලව තොරතුරු ඉල්ලා සිටීම සඳහා වන බලයට අගතියක් සිදු නොවේ.

3. මෙම කොන්දේසියෙහි :

''තොරතුරු'' යන්නට කොමිෂන් සභාව විසින් නියම කරන ලද කිසියම් විස්තරයක සහ කිසියම් ආකෘතියක සකස් කරන ලද කිසියම් පොත්, ලේඛන, වාර්තා, ගිණුම්, ඇස්තමේන්තු, විස්තර හෝ වාර්තා (කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටි පරිදි සකස් කර තිබුණ ද හෝ නොතිබුණ ද) ඇතුළත් විය යුතු ය.

**කොන්දේසිය 3 : කොමිෂන් සභාවෙහි තීරණ, නියෝග, විධානය සහ තීරණ**

බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙක් එම නිදහස් කිරීම් නියෝගයට අනුව සිදුකරන ලද ඕනෑම තීරණ, නියෝග, විධාන සහ නිර්ණයන් සමගින් අනුකූල විය යුතු ය.

එවැනි තීරණ, නියෝග, විධිවිධාන හා නිර්ණයන් හා අනුකූල ඒ හා ආශ්‍රිත සාධාරණ පිරිවැය බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙක් ගේ වගකීම විය යුතු ය.

1. කොමිෂන් සභාව විසින් සකස් කරනු ලබන කිසියම් නියෝගයක් හෝ විධානයක් සමගින් අනුකූලවීම පිණිස, කොමිෂන් සභාව විසින් අවශ්‍ය කරනු ලබන පරිදි ස්වකීය දේපළ සඳහා පිවිසීමට හෝ ඒවා පාලනය කිරීමට, කොමිෂන් සභාවට, වෙනත් බලධාරියෙකුට හෝ කොමිෂන් සභා නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති වෙනත් කිසියම් බලධාරියෙකුට හෝ තැනැත්තෙකුට ඉඩ ලබාදිය යුතු ය.

**කොන්දේසිය 4 : තාක්ෂණික සහ මෙහෙයුම් නීති සංග්‍රහයන් සමගින් අනුකූලතාවය**

1. කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටින පරිදි, බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙක්, කිසියම් විදුලිබල ව්‍යාපාරයක උපදේශනය සහිතව කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරන පරිදි, එවන් තාක්ෂණික සහ මෙහෙයුම් නීති සංග්‍රහයන් ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු ය.

2. I වන ඡේදය ප්‍රකාරව ගොඩ නගන ලද කිසියම් තාක්ෂණික සහ මෙහෙයුම් නීති සංග්‍රහයන් ක්‍රියාත්මක කිරීමට පෙර අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙකුට, අදාළ නීති සංග්‍රහයේ දක්වා ඇති නීති සංග්‍රහ සංශෝධන ක්‍රියාවලියට අනුකූලව කොමිෂන් සභාවට දැනුම්දීම මගින් අදාළ කාලය තුළ බලාත්මකව පවතින නීති සංග්‍රහයකට සංශෝධනයන් යෝජනා කළ හැකි ය.

4. බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙක් විසින් මෙම කොන්දේසියට අනුකූලව ගොඩනගන ලද සහ ක්‍රියාත්මක කරන ලද අනුමත කළ සියළු තාක්ෂණික සහ මෙහෙයුම් නීති සංග්‍රහන්හි (සහ එයට වන කිසියම් ප්‍රතිශෝධනයක්) පිටපතක් එකී බලපත්‍රවලින් නිදහස් පුද්ගලයා විසින් :

(අ) කොමිෂන් සභාවට ; සහ

(ආ) එය ඉල්ලා සිටින කිසියම් තැනැත්තෙකුට, ලබාදීම හෝ යැවීම කළ යුතු ය.

5. බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙකුට, 4 (ආ) ඡේදයට අනුව ලබාදුන් හෝ යවන ලද කිසියම් සංග්‍රයක පිටපතක් සඳහා කොමිෂන් සභාව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විධානයන්හි මෙම කොන්දේසියෙහි කාර්යය සඳහා අදාළ කාලය සඳහා නියම කර ඇති කිසියම් මුදලක් නොඉක්මවන මුදලක් අය කිරීම කළ හැකි ය. බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙකු එයට අදාළ වන පරිදි මෙහි නියම කරනු ලබන කවර හෝ අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් නීති සංග්‍රහයන්හි විධිවිධාන පිළිපැදිය යුතු ය.

6. කොමිෂන් සභාව, අදාළ අවස්ථාවන්හි දී, කොමිෂන් සභාව විසින් යෝග්‍ය බවට සැලකෙන කිසියම් විදුලිබල ව්‍යාපාරයක උපදේශනය සහිතව, ඕනෑම අනුමත තාක්ෂණික සහ මෙහෙයුම් නීති සංග්‍රහයක එකී කොටස හෝ කොටස් සම්බන්ධයෙන් 6 වෙනි ඡේදය යටතේ පවත්නා බැඳීම්වලින් බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙකුට සහනය සලසමින්, එකී නියෝගයන්හි නියම කර ඇති ප්‍රමාණයට සහ කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි එකී නියමයන් සහ කොන්දේසිවලට යටත්ව නියෝග කරනු ඇත.

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාක්ෂණික සහ මෙහෙයුම් නීති සංග්‍රහයන් ලබාගන්නා තෙක් බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙකු සියලුම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනට පවත්නා තාක්ෂණික සහ මෙහෙයුම් නීති සංග්‍රහයන් හා අනුකූල විය යුතු ය.

**කොන්දේසිය 5 : පරිසරය**

1. බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙකුට පිරිනැමිය හැකි යම්කිසි නිදහස් කිරීමකට හෝ සහන කාලයකට යටත්ව, ශ්‍රී ලංකාවේ අදාළ සියලුම පාරිසරික නීති සමගින් බලපත්‍රවලින් නිදහස් පුද්ගලයා අනුකූල විය යුතු ය.

2. මෙම බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙකුගේ කාර්යය සඳහා ''පාරිසරික නීති'' යන්නට, අවිශ්වාසයන් වැළක්වීම පිණිස 1980 අංක 47 දරන පාරිසරික පනත සහ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම, වාතය, ගොඩබිම සහ ජලය ආරක්ෂා කිරීම අදාළ සියලුම නීති සම්පාදනයන් ද ඇතුළත්ව, නමුත් එයට සීමා නොවී, මානව සෞඛ්‍යය, ශාක, සත්ත්ව විශේෂ සහ ඔවුන් පදනම් වන පරිසර පද්ධතියෙහි සුරක්ෂිත භාවය ද ඇතුළුව, ස්වකීය අරමුණ පරිසරය ආරක්ෂා කිරීම වන කලින් කලට බලාත්මක වන එම නීති අදහස් වේ.

**කොන්දේසිය 6 : සෞඛ්‍යය සහ ආරක්ෂාව**

1. විදුලි උත්පාදනය කිරීම හා බෙදාහැරීම් කටයුතු සිදු කරන විට, බලපත්‍රවලින් නිදහස් තැනැත්තෙකු විසින් සිදු විය හැකි තුවාල සහ හානිවලින් පුද්ගලයන්, පිරියත, දේපළ සහ උපකරණ ආරක්ෂා කිරීම සඳහා සියලු සාධාරණ පියවර බලපත්‍රවලින් නිදහස් තැනැත්තෙකු විසින් ගත යුතු ය.

**කොන්දේසිය 7 : ආරවුල් විසඳීම**

1. බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙක්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත යටතේ කොමිෂන් සභාව විසින් සකසන ලද නීති රීතිවලට අනුව ආරවුලක් සම්බන්ධයෙන් විසඳුමක් ලබාගැනීමට, එය එකී නීති රීති හා අනුකූලව කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, කොමිෂන් සභාව විසින් නියම කර ඇති අවස්ථාවක දී, 1995 අංක 11 දරන බේරුම්කරණ පනත අනුව ආරවුල අධිකරණය හෝ බේරුම්කරණ මණ්ඩලය වෙත යොමුකළ යුතු ය.

**කොන්දේසිය 8 : විදුලිබල උත්පාදන පිරියත**

1. බලපත්‍රලාභී හෝ බලපත්‍රවලින් නිදහස් වෙනත් කිසියම් පිරියතයකින් විද්‍යුතමය වශයෙන් පිරියත වෙන්ව පැවතිය යුතු ය.

2. බලපත්‍රලාභී හෝ බලපත්‍රවලින් නිදහස් අනිකුත් බෙදාහැරීම් පද්ධතීන්ගේ විද්‍යුත් ජාලයන් සමගින් පිරියත විද්‍යුතමය වශයෙන් වෙන්ව පැවතිය යුතු ය.

**කොන්දේසිය 9 : බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙකුට විදුලි සම්බන්ධතාවය සැපයීම සම්බන්ධයෙන් වෙනස් කොට නොසැලකීම**

1. බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙක් ගේ බෙදාහැරීම් පද්ධතිය සඳහා විදුලිබල සම්බන්ධතාවය ලබාදීමේ අරමුණ පිණිස වන කාර්යයන් සිදුකිරීමේ දී හෝ බලපත්‍රවලින් නිදහස් පුද්ගලයින්ගේ විදුලිබල සම්බන්ධතාවය රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් බලපත්‍රවලින් නිදහස් පුද්ගලයෙක් කිසිදු පුද්ගලයෙකුගෙන් හෝ පන්තියකින් හෝ පුද්ගල පන්තීන් අතරින් අයුතු ලෙස වෙනස් කොට සැලකීම නොකළ යුතු ය.

**කොන්දේසිය 10 : සැපයුමෙහි දී සිදුවන වෙනස්කොට සැලකීම තහනම් කිරීම**

1. බලපත්‍රවලින් නිදහස් පුද්ගලයින්, පාරිභෝගිකයින් වෙතට විදුලිබලය සැපයීම සඳහා කොන්දේසි සැපයීමේ දී හෝ පිරිනැමීමේ දී, :

(අ) කිසිදු පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට අයුතු ලෙස මනාපය දැක්වීම ;
(ආ) කිසියම් පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායම් අතර අයුතු වෙනස් කොට සැලකිල්ලකට භාජනය කිරීම ;
හෝ
(ඇ) අයුතු ලෙස බරපතල නියමයන් පැනවීම.
සිදු නොකළ යුතු ය.

2. මෙම කොන්දේසියේ අරමුණු සඳහා එකී නියමයන් මත පාරිභෝගිකයින්ට විදුලිබලය සැපයීමෙන් ලැබෙන ආදායම එකී සැපයුම සඳහා වන පිරිවැය සැලකිය යුතු ලෙස ඉක්මවා යන්නේ නම්, කොන්දේසි අයුතු ලෙස බරපතල ඒවා ය.

3. මෙම කොන්දේසියේ අරමුණු සඳහා, ගැටළුවට තුඩුදුන් පාරිභෝගිකයින් සඳහා විදුලිබලය සැපයීමේ ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන පිරිවැය සාධාරණ ලෙස ආවරනය නොකරන ගාස්තු එවැනි නියමයන් හි අන්තර්ගත වන්නේ ද යන්න පිළිබඳ නිසි සැලකිල්ලට ගෙන, කිසියම් නියමයක් අයුතු ලෙස බරපතල වන්නේ දැයි යන ඕනෑම ප්‍රශ්නයක් කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

4. මෙම කොන්දේසියේ දී :
''නියමයන්'' යන්නෙන් විදුලි සැපයුමක් තක්සේරුකිරීමේ දී සැලකිය යුතු බලපෑමක් සහිත මිළ නියමයන් ද ඇතුළුව, එකී විදුලිබල සැපයුම පිරිනමන හෝ ලබාදෙන සියලුම නියමයන් අදාළ වේ.

04 - 645

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.